
# 2021

# ග්‍රාම සංවර්ධන සැලැස්ම

## 539/42 A
## මල්වත්ත



ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-දෙහිවල

# 539/42 A -මල්වත්ත

# ග්‍රාම සංවර්ධන සැලැස්ම



ආර්ථික සංවර්ධන නිලධාරී

චානක රුවන් රාජපක්ෂ මහතා

# පටුන



| **මාතෘකා.** | **පිටු අංකය** |
|---|---|
| 1. පිහිටීම හා වසම හැඳින්වීම. | 1 |
| 2. යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම. | 2 |
| 3. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන සැලැස්ම. | 3-4 |
| 4. සමාජ සංවර්ධන සැලසුම. | 5-11 |
| 5. පරිසර කළමනාකරණ හා ආපදා කළමනාකරණ සැලසුම්. | 11-14 |
| 6. ජීවනෝපාය සංවර්ධන සහ ව්‍යවසාය සංවර්ධන සැලැස්ම. | 15 |
| 7. කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම. | 16-17 |
| 8. නිපුණතා සංවර්ධන හා හැකියා වර්ධන සැලැස්ම | 18-19 |
| 9. තරුණ සංවර්ධන හා කාන්තා සවිබලකරණ සැලැස්ම. | 19-20 |
| 10.ඇමුණුම 1 | 21 |
| 11.ඇමුණුම 2 | 22-23 |
| 12.ඇමුණුම 3. | 25 |

## 1.පිහිටීම හා වසම හැඳින්වීම - මල්වත්ත වසම

උතුරින් දෙහිවල නැගෙනහිර වසමද දකුණින් කරගම්පිටිය වසම ද නැගෙනහිරින් උද්‍යාන වසමද බටහිරින් ජයතිලක වසම ද පිහිටා ඇත. මල්වත්ත වසමේ විශාලත්වය වර්ග කිලෝමීටර් 0.45 ක් පමණ වේ. මල්වත්ත වසම පූර්ණ නාගරික බල ප්‍රදේශයකි. මල්වත්ත කොට්ඨාශය සමන්විත පාරවල් වනුයේ අනගාරික ධර්මපාල මාවත, ගල්වල පාර, ප්‍රියදර්ශනාරාම පාර, මේධංකර පාර, සුදර්ශනාරාම පාර, ජයවර්ධන පෙදෙස, වෛද්‍ය පාර, වෛද්‍ය මාවත, ලියනගේ පාර, ධර්මරාජ පාර, පැරණි වෛද්‍ය පාර, මල්වත්ත හරස් පාර, මල්වත්ත පාර, ගල්විහාර පාර අයත් වේ. මුහුදු බඩ ආශ්‍රිතව වෙරළබඩ පිහිටා ඇති ජයතිලක වසමට මීටර් 650ක් පමණ දුරකින් පිහිටා ඇත. මල්වත්ත වසම තුළ විවිධ ජාතීන් සංහිඳියාවෙන් හා සහජීවනයෙන් කොට්ඨාශය තුල ජීවත් වන අතර සිංහල මිනිසුන් 2313 පමණද, ලංකා දමිල 226 පමණද, යෝනක ජනයා 966 පමණද වෙනත් ජාතීන් නියෝජනය කරමින් 39 මෙම වසම තුළ වෙසෙති. ජාතික මට්ටමේ පාසලක් ලෙස කොට්ඨාශය තුල සංවර්ධනය කළ හැකි එහෙත් දැනට ප්‍රාථමික විද්‍යාලයක් ලෙස ළමුන් අඩු සංඛ්‍යාවක් පැමිණෙන විජය විද්‍යාලය සතුව මනාව වගා කලහැකි පර්චස් 80ක පමණ අතිරේක බිම් තීරුවක් ඇත. කොට්ඨාශය තුල ස්ථාපිත රාජ්‍ය ආයතන වනුයේ කරගම්පිටියේ පිහිටා ඇති මහජන සෞඛ්‍යය පරීක්ෂක කාර්යාලය, විජය විද්‍යාලය, දෙහිවල-ගල්කිස්ස පශු වෛද්‍ය කාර්යාලය, අනගාරික ධර්මපාල මාවතේ පිහිටා ඇති දෙහිවල-ගල්කිස්ස කෝප්සිටි සමුපකාරය, කරගම්පිටිය ග්‍රාමීය බැංකුව හා අනගාරික ධර්මපාල මාවත අංක 180 හි පිහිටා ඇති ග්‍රාම නිලධාරී කාර්යාලයද වේ. නාගරික ප්‍රදේශයක් වුවද මල්වත්ත පාර, වෛද්‍ය පාර හා ඒ ආශ්‍රිතව නාගරික පැල්පත් ද පිහිටා ඇත. ධනවත් ඉහළ මධ්‍යම පාන්තික හා මධ්‍යම පාන්තික පවුල් ද, දිළිඳු කමින් මිරිකී ගිය සුහසාධනය අවශ්‍ය පවුල් ද මෙම වසම තුළ වාසය කරනු ලබයි.

ස්ථිර වහලක් සහිත තනි නිවාස 830 ක් පමණද පවුල් කිහිපයක් හවුලේ පදිංචි ස්ථිර වහලක් සහිත අංගසම්පූර්ණ තනි නිවාස 30 ද, තට්ටු නිවාස සංකීර්ණයක නිවාස පනහක් පමණ ද, තාවකාලික නිවාස දෙකක්ද, වෙනත් නිවාස අනු තුනක්ද, සමස්ථයක් ලෙස කොට්ඨාශය තුල 1015 පමණද නිවාස ඇත. මිශ්‍ර සමාජ සංස්කෘතික පරිසරයක් මෙම වසම තුළ දක්නට ලැබේ. ගමේ මුල් පදිංචිකරුවන් ආර්ථික කාරණා අරබයා නිවාස විකුණා වෙනත් ගම් ප්‍රදේශ වෙත සංක්‍රමණය වී ඇත. වසම තුළ මාර්ග පද්ධතිය කොට්ඨාශය පුරා පැතිරී ඇත හොඳ තත්ත්වය පවතින කාපට් පාරවල් හතරක් පමණ ද, හොඳ තත්වයේ පවතින තාර යෙදූ මාර්ග හතරක් පමණ ද, හොඳ තත්වයේ පවතින කොන්ක්‍රීට් මාර්ග තුනක් පමණද පවතී. කලින් සංවර්ධනය කර තිබී අබලන් වී ඇති මාර්ග සංඛ්‍යාව 7 කි. කොට්ඨාශය තුල සුදර්ශන සිතමු ගොවි සංවිධානය නමින් ගමේ සාමාජික පවුල් 25ක් පමණ සමන්විත වන ගොවි සංවිධානයක් ඇත. නාගරික බල ප්‍රදේශයක් තුළ මෙලෙස ප්‍රබල ගොවි සංවිධානක් පැවැතීම මල්වත්ත කොට්ඨාශයේ වැසියන්ට අභිමානයට පත්වීමට හැකි කාරණාවකි.

# <u>වසම් සිතියම.</u>




## <u>2.යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම</u>

මූලිකව භෞතික වශයෙන් සංවර්ධනය කළ හැකි මාර්ග, පාලම්, බෝක්කු, පැති බැම් සංවර්ධනය හා නවීකරණය කිරීම, වාරිමාර්ග පද්ධතින් ස්ථාපනය කිරීම මීට අයත් වේ. යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේදී සමහර ග්‍රාම සංවර්ධන සැලසුම් කරුවන් එය ආර්ථික යටිතල පහසුකම් හා සමාජ යටිතල පහසුකම් ලෙසින් කොටස් දෙකකට වර්ගීකරණය කරනු ලබයි. සමාජ යටිතල පහසුකම් සංවර්ධනය යටතේ පාසල්, පෙර පාසල්, මාතෘ සායන, තැපැල් කන්තෝරු, පුස්තකාල පහසුකම් සංවර්ධනය ප්‍රමුඛ වේ. යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රජා අවශ්‍යතා මත උසස් ප්‍රමිතියකින් නිසි පිරිවැය කළමනාකරණය කිරීමකින් තොරව සිදු කිරීම ඉමහත් අපරාධයකි. එය රටක ආර්ථික ස්ථායිතාව අඩාල කිරීමටද වක්‍රව බලපානු ලබයි.

**<u>ගැටලුව :-</u>**

රාජ්‍ය නිලධාරීන් සඳහා නිශ්චිත ස්ථානයක් නොමැති බැවින් මහජන අවශ්‍යතා ඉටු කරලීමට යෑමේදී මහජනතාවට, නිලධාරීන්ට ඇති වන අපහසුතා මත කාර්යක්ෂම රාජකාරීන් සිදුකරගෙන යාමේදී දුෂ්කරතා මතු වීම.

**<u>අරමුණ :-</u>**

1. රාජ්‍ය නිලධාරීන්ට හා සේවා ලාභීන්ට එකම ස්ථානයක පහසුකම් සැලසීම හා කෙටි කාලයකින් අඩු වියදමකින් ප්‍රශස්ත සේවාවක් ලබාගැනීමට අවකාශ සැලසීම.

2. එකම පියසක් තුළ සියලුම රාජ්‍ය නිලධාරීන් ජනතාවාදී සේවාවක් ලබාදීම මුඛ්‍ය අරමුණයි.

**උපාය මාර්ග:-**

1. සියලුම රාජ්‍ය නිලධාරීන්ට පහසුකම් සපිරි ගොඩනැගිල්ලක් නිමවීම.
2. සියලුම රාජ්‍ය නිලධාරීන් ජනතාවට කාර්යක්ෂමව උපරිම සේවාවක් ලබාදීමට එකම දිනක රාජකාරීන් සඳහා වාර්තා කිරීමට අවකාශ සැලසීම.

**ක්‍රියාකාරකම:-**

කරගම්පිටිය සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථාන භූමියේ ඇති පර්චස් 45ක පමණ ඉඩමේ සුදුසු ගොඩනැගිලි පරිශ්‍රයක් ඉදිකර ඒ තුළ කියවීමේ හා ප්‍රජා ශාලාවක්, මාතෘ හා ළමා සායනයක් ග්‍රාම නිලධාරී කාර්යාලයක් ස්ථාපිත කිරීම.

**කාලය :-**

වසර එකයි

**ප්‍රතිලාභී පවුල්:-**1005

**වගකීම :-**

දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

## 3.යටිතල පහසුකම් සංවර්ධන සඳහා වන සැලැස්ම

**ගැටලුව :-**

මාර්ග පද්ධතිය අබලන් වීම නිසා එදිනෙදා කාර්යයන් සඳහා වැයවන කාලය හා ප්‍රමාදවීම් උපරිමවේ.අනතුරු ඇතිවීම්ද සිදුවේ. එය වළක්වා ගැනීම සිදු කිරීම කළ යුතුය.

**අරමුණ:-**

උසස් ප්‍රමිතියකින් යුතු දීර්ඝකාලීන පැවැත්මක් සහිත මාර්ග පද්ධතියක් සැකසීම හා මාර්ග පද්ධතියට අවශ්‍ය අවශේෂ පහසුකම් සැපයීම.

**උපායමාර්ග:-**

තාක්ෂනික නිලධාරීන්ගේ ඇස්තමේන්තු හා සැලසුම් යටතේ සංවර්ධන නිලධාරීන්ගේ, අධීක්ෂණය මත පරීක්ෂාකර බලා යෝග්‍ය තාක්ෂණික ක්‍රම වේදයන් යටතේ දිගුකාලීන පැවැත්මක් තහවුරු වන පරිදි සංවර්ධනය කිරීම.

**<u>ක්‍රියාකාරකම්</u> :-**

1. ගල්විහාර පාර අංක 266 සිට අංක 264 A දක්වා කානු ප්‍රතිසංස්කරණය කර ස්ලැබ් කවර යෙදීම
2. ගල්විහාර පාර අංක 252/2 සිට 254 දක්වා අතුරු මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කර කාණු පද්ධතිය ක්‍රමවත්ව සැකසීම.
3. මේධංකර පාර අංක 2 සිට අංක 23 දක්වා පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම. - දිග මීටර් දෙසීයයි
4. වෛද්‍යා පාර අංක 92/1සිට අංක 92/13 දක්වා කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම. - දිග මීටර් එකසිය විස්සයි
5. වෛද්‍යා මාවත අංක 14/20 සිට අංක 14/19 දක්වා පාර මීටර් එකසිය විස්සක් පමණ වන අතුරු මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම.
6. මල්වත්ත පාර අංක 63 සිට අංක 117 දක්වා කොටසේ කානු සංවර්ධනය කර කොන්ක්‍රීට් ස්ලැබ් කවර යෙදීම. - දිග මීටර් 300 යි, වියදම ලක්ෂ විස්සයි
7. මල්වත්ත පාර අංක 60 සිට අංක 117 දක්වා දිග මීටර් හාරසියයක් පමණ වන කොටස, කාපට් යොදා සංවර්ධනය කිරීම. වියදම ලක්ෂ විස්සයි, දිග මීටර් 400 පමණ
8. සුදර්ශන පාර කාපට් කිරීම දිග මීටර් 400 පමණ වියදම ලක්ෂ විස්සයි
9. අනගාරික ධර්මපාල මාවත අංක දෙසිය තුනෙන් පටන් ගන්නා අතුරු මාර්ගය අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් අල්ලා සංවර්ධනය කිරීම වියදම ලක්ෂ 5
10. මල්වත්ත කොට්ඨාශම ආවරණය වන ලෙස එල්. ඊ. ඩී ලාම්පු පද්ධතියක් ස්ථාපිත කිරීම. වියදම ලක්ෂ හැටයි කාලය වසර එකයි ප්‍රතිලාභීන් පවුල් 1005 වගකීම දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව.

**<u>ගැටලුව</u> :-**

මල්වත්ත වසමේ බොහෝ ප්‍රදේශ වලට බලපාන පරිදි මල නල පද්ධතියක් අක්‍රමවත්ය. ඒ හේතුවෙන් තැන්තැන්වල පැරණි මළ නල පද්ධතින්හි කාන්දු වීම් නිසා සෞඛ්‍ය තර්ජන ද මතුව පවතී.

**<u>අරමුණ</u> :-**

දීර්ඝකාලීන කල් පැවැත්මක් සහිත ක්‍රමවත් මල නල පද්ධතියක් සැකසීම හා හැකිතරම් කඩිනම්ව ප්‍රජාව වෙත අවශේෂ පහසුකම් සම්පාදනය කරදීම.

**<u>උපායමාර්ග</u> :-**

ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවහන මණ්ඩලයේ ඉංජිනේරුවන්ගේ අධීක්ෂණය හා තාක්ෂණික ඉංජිනේරුමය උපදෙස් මත දිගු කාලීන පැවැත්මක් ඇති කරනු සඳහා පැරණි මල පද්ධතිය ක්‍රමවත් නවීකරණය කිරීම.

**ක්‍රියාකාරකම් :-**

මල්වත්ත පාර, මල්වත්ත හරස් පාර ලියනගේ පාර අංක 48 සිට 75 දක්වා මලඅපවහන පද්ධතිය ක්‍රමවත්ය. ඉතිරිව ඇති මාර්ග හා ප්‍රදේශ ආවරණය වන පරිදි අක්‍රමවත්ව පවතින මලාපවහන පද්ධතිය ක්‍රමවත්ව නවීකරණය කර සංවර්ධනය කිරීම.

**කාලය :-**

වසරේ එකයි

**ප්‍රතිලාභීන් පවුල් :-**

850යි

**වගකීම :-**

ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය

## 4.සමාජ සංවර්ධන සැලැස්ම - මල්වත්ත වසම :-

**හැදින්වීම:-**

සමාජ සංවර්ධනය හුදු භෞතික සංවර්ධනයක් ම පමණක් නොවේ. එය භෞතික සංවර්ධනයට එහා ගිය ප්‍රජාව සමග බද්ධ වූ ප්‍රජාව ගේ ආධ්‍යාත්මයට පවා ආමන්ත්‍රණය කරන්නා වූ සංකීර්ණ ක්‍රියාවලියකි. එහි අන්තර්ගතය සමාජ සුරක්ෂිත බව, ප්‍රජාව ගොඩනැංවීම හා මනා වූ සන්නිවේදනය, ආර්ථිකමය හා වෘත්තීයමය අවස්ථා මත රැඳී පවතී.

**ගැටලුව :-**

වැඩිහිටියන් සමාජයේ හුදෙකලා වීමෙන් පීඩාවට පත්වීම.

**අරමුණ**

හුදෙකලා වියපත් වැඩිහිටියන් සක්‍රීය සමාජ ක්‍රියාකාරීන් පිරිසක් බවට පත් කිරීම.

**උපාය මාර්ග :-**

වැඩිහිටියන් සවි බලකරණය කිරීම සඳහා සමාජ ක්‍රියාකාරකම් වලට උපරිමව දායක කර ගැනීම.

**ක්‍රීයාකාරකම්:-**

වැඩිහිටි සුහද හමු පැවැත්වීම, වැඩිහිටි අවුරුදු උළෙලවල් පැවැත්වීම, ප්‍රදේශයේ වැඩිහිටි සමිති, ජ්‍යේෂ්ඨ පුරවැසි සමිති වලට බඳවා ගැනීම. විනෝද චාරිකා සඳහා වැඩිහිටියන් සහභාගි කරවා ගැනීම.

**කාලය :-**වසර එකයි

**ප්‍රතිලාභීන් :-**300යි

**වගකීම :-**සමාජ සේවා නිලධාරී

**ගැටළුව :-**

පෙර පාසල් හා පාසැල් වයසේ පසුවන දරුවන්ගේ පෝෂණ වර්ධන ගැටලු අර්බුදකාරි අයුරින් මතුවීම.

**අරමුණ :-**

බල ප්‍රදේශයේ පාසල් ළමුන්ගේ පෝෂණ ගැටලූ අවම කිරීම හා නිරෝගිමත් සෞඛ්‍ය සම්පන්න මානව සම්පතක් ඇති කිරීම

**උපායමාර්ග:-**

1. පාසැල් ළමුන් සජීවීව පෝෂණය නංවාලීමේ වැඩසටහන් සඳහා සහභාගි කරවා ගැනීම.
2. පවුල් සෞඛ්‍ය නිලධාරීන් හා මහජන සෞඛ්‍යය පරීක්ෂක නිලධාරීන් සමග සම්බන්ධීකරණයෙන් දරුවන් සුපෝෂණ වැඩසටහන් සඳහා යොමු කරවා ගැනීම.

**ක්‍රියාකාරකම්:-**

1. පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
2. පාසල් ළමුන් සඳහා දිවා ආහාර ලබාදීම.

**කීම :-**

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, දේශීය ආයුර්වේද වෛද්‍ය නිලධාරී.

**ගැටලුව :-**

1. අඩු බර සහිතව උපත ලද ලමුන්ගේ පෝෂණ වර්ධන ගැටලු මතුවීම

**අරමුණ :-**

නියමිත බර සහිතව නිරෝගිමත් දරු පරපුරක් ඇති කරලීම.

**උපායමාර්ග :-**

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් හා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්, ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, දේශීය වෛද්‍ය නිලධාරීන් හරහා පෝෂණ වැඩසටහන් පාසල් හා පෙර පාසැල් තුළ පැවැත්වීම

**<u>ක්‍රියාකාරකම් :-</u>**

1. අඩු බර සහිත දරුවන් සඳහා ත්‍රිපෝෂ ලබා දීමේ වැඩසටහන් හා සමාජ සත්කාරක සේවා සැපයීම.
2. මාතෘ සායන සඳහා සහභාගි නොවන මව්වරුන් හා ළමුන් ඒ සඳහා යොමු කරවීමට උනන්දු කරවීම.
3. නිවැරදි හා සමබර පාරිභෝජන රටාවකට දරුවන් හා මව්වරුන් යොමුකරවීම.
4. අඛණ්ඩව හා මනා අධීක්ෂණයෙන් යුතුව පෝෂණ වැඩසටහන් ප්‍රජා මට්ටමින් සක්‍රියව පැවැත්වීම.

**<u>කාලය :-</u>**වසර එකයි

**<u>වගකීම :-</u>**

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්.

**<u>ගැටලුව :-</u>**

2. ගර්භනී මාතාවන්ගේ පෝෂණ වර්ධනය සම්බන්ධ ගැටලු මතුවීම.

**<u>අරමුණ :-</u>**

කායික හා මානසික වශයෙන් නීරෝගීමත් මව්වරුන් බිහිකිරීම.

**<u>උපායමාර්ගය</u>:-**

මව්වරුන් පෝෂණය සම්බන්ධ වැඩසටහන් වලට සම්බන්ධ කරවා ගැනීම හා පවුල් සෞඛ්‍ය නිලධාරීන් හරහා නිරන්තරව අධීක්ෂණයට ලක් කිරීම.

**<u>ක්‍රියාකාරකම්</u> :-**

1. මාතෘ සායන සඳහා සහභාගි නොවන මවුවරුන් හා ළමුන් ඒ සඳහා යොමු කරවීමට උනන්දු කරවීම
2. නිවැරදි හා සමබර පාරිභෝජන රටාවකට මව්වරුන් යොමුකරවීම.

**<u>කාලය :-</u>**වසර එකයි

**<u>වගකීම</u> :-**

MOH කාර්යාලය, දෙහිවල, පවුල් සෞඛ්‍ය නිලධාරීන්, ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්.

**ගැටලුව:-**

කොට්ඨාශයේ යෞවනය හා ඇතැම් වැඩිහිටි පිරිස් මත්ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් වලට ඇබ්බැහි වීම.

**අරමුණ :-**

ළමුන් යෞවනයන් හා වැඩිහිටියන් මත් ද්‍රව්‍ය බාවිතයෙන් තොරව සුමගට යොමුකරවීම.

**උපායමාර්ගය :-**

මත්ද්‍රව්‍ය භාවිතයෙන් වන හානිය ළමුන් යෞවනයන් හා වැඩිහිටි ප්‍රජාව අතර ප්‍රචලිත කිරීම හා ඔවුන් ක්‍රියාකාරීව ප්‍රජාපාදක වැඩසටහන් වලට සම්බන්ධ කරවා ගැනීම.

**ක්‍රියාකාරකම් :-**

1. අන්තරායකාරී ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් සිදුකරන දැනුවත් කිරීමේ වැඩසටහන් හා පසු විපරම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා යොමු කරවීම.
2. සිවිල් ආරක්ෂක කමිටු සක්‍රිය කිරීම
3. මත්ද්‍රව්‍ය භාවිතය හා අලෙවි කරන්නන් නීතියේ රැහැනට හසුකර ගැනීමේ වැඩසටහන් සක්‍රීයව ක්‍රියාත්මක කිරීම.
4. මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් වෙනුවෙන් පුනරුත්ථාපන හා ප්‍රජා විශෝධන වැඩසටහන් පැවැත්වීම හා අදාළ මධ්‍යස්ථාන කරා ඔවුන් යොමුකරවීම.
5. මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව හා අවදානම දැක්වෙන වැඩසටහන් ක්‍රියාත්මක කර ප්‍රජාව ඒ සඳහා යොමු කරවීම.
6. චිත්‍ර, පෝස්ටර්, පෙරහැර හා වීඩියෝ දර්ශන ඇසුරෙන් එම වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකිය.

**කාලය:-**

වසර එකයි

**වගකීම :-**

මත්ද්‍රව්‍ය නිවාරණ නිලධාරීන්, උපදේශන සේවා නිලධාරී, සමාජ සේවා නිලධාරීන්.

**ගැටලුව :-**

කොට්ඨාශය තුළ අඩු ආදායම්ලාභීන් හා දිළිඳු ප්‍රජාව අතර සනීපාරක්ෂක පහසුකම් ප්‍රශස්ත මට්ටමක නොපැවතීම මත බෝවන රෝගවලට ගොදුරු වීම වර්ධනය වීම.

**අරමුණ :-**

විධිමත් සනීපාරක්ෂක පහසුකම් ක්‍රමිකව ඇති කරලීම තුළින් බෝවන රෝගවලට ගොදුරු වීම අවම කරලීම.

**උපාය මාර්ගය :-**

නිසි පරිදි සනීපාරක්ෂක ඉදිකිරීම් නියාමනය හා සුපරීක්ෂණ කිරීම.

**ක්‍රියාකාරකම්:-**

1. අබලන් තත්ත්වයේ වැසිකිළි තිබෙන අයට වැසිකිළි නැවත ඉදිකිරීම සඳහා මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලබා දීම.
2. ආබාධිත හා සුවකළ නොහැකි රෝගීන් සඳහා වැසිකිළි ආධාර ලබාදීම.
3. පොදු වැසිකිළි නවීකරණය කිරීම .

**වගකීම:-**

සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, සමාජ සේවා නිලධාරීන්

**කාලය :-**

වසර එකයි

**ගැටලුව:-**

ප්‍රදේශයේ පිහිටා ඇති විජය විද්‍යාලයේ ක්‍රීඩා පහසුකම් හා අවශ්‍ය යටිතල පහසුකම්හි පවතින ගැටලු හේතුවෙන් ළමුන් පාසල වෙත යොමු කරවා ගැනීම සම්බන්ධයෙන් පවතින දුෂ්කරතාවයන්.

**අරමුණ :-**

විජය විද්‍යාලය ශක්තිමත් කර ළමුන් විදුහල වෙත ආකර්ශණය කරවා ගැනීම

**උපායමාර්ගය :-**

මධ්‍යම පාන්තික හා ඉහළ ආදායම් ලබන පවුල් වල දරුවන් පාසලට ආකර්ෂණය කරගැනීමට පාසල් සංවර්ධනය කිරීම සඳහා එහි සමාජ යටිතල පහසුකම් උපරිම තලයකට රැගෙන ඒම හා ගුරුවරු ඒ සඳහා අනුයුක්ත කිරීම

**<u>ක්‍රියාකාරකම්:-</u>**

විජය විද්‍යාලයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

1. ක්‍රමවත් වැසිකිළි පද්ධතියක් ලබාදීම
2. ළමුන් සඳහා විදුහල තුළ ක්‍රීඩා උපකරණ සවි කිරීම
3. සාමාන්‍ය පෙළ හා උසස් පෙළ පන්ති අරඹා සුදුසු ගුරුවරුන් විදුහලට අනුක්ත කිරීම

**<u>වගකීම :-</u>**

කලාප අධ්‍යාපන කාර්යාලය, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**<u>කාලය :-</u>**

වසර දෙකයි

**<u>ගැටලුව :-</u>**

වැඩිහිටි හා වියපත් ප්‍රජාව අතර බෝ නොවන රෝග සුලබ වීම

**<u>අරමුණ :-</u>**

කොට්ඨාශය තුළ කායික හා මානසික සමබරතාව හා නිරෝගීමත් බවින් පිරිපුන් පුරවැසියන් බිහිකිරීම

**<u>උපායමාර්ගය :-</u>**

ක්‍රීඩා නිලධාරී, තරුණ සේවා නිලධාරී සංවර්ධන නිලධාරී හරහා තරුණ තරුණියන්, වැඩිහිටි ප්‍රජාව සම්බන්ධීකරණයෙන් යෝග්‍ය වැඩ පිළිවෙළක් සකස් කිරීම

**<u>ක්‍රියාකාරකම් :-</u>**

1. ශාරීරික යෝග්‍යතාව වර්ධනය වන උචිත ශාරීරික ක්‍රියාකාරකම් සඳහා වැඩිහිටි හා වියපත් පිරිස් යොමු කරලීම.
2. මානසික සුවතාවය උදෙසා යෝගා භාවනා හා යෝගාශ්‍රිත සුවතා වැඩසටහන් වලට ප්‍රජාව යොමුකරවීම.
3. ක්‍රීඩා සමිති හා යෞවන සමිතිය යාවත්කාලීන කිරීම.
4. ශාරීරික යෝග්‍යතාව සඳහා උචිත ව්‍යායාම උපකරණ ලබාදීම.

**<u>කාලය:-</u>**වසර එකයි

**<u>වගකීම:-</u>**

ක්‍රීඩා නිලධාරී, මනෝ සංවර්ධන උපදේශ නිලධාරී. දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ ක්‍රීඩා ඒකකය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාල දෙහිවල,

**ගැටලුව :-**

කොට්ඨාශය තුළ විධිමත් අයුරින් දේශීය ඖෂධ ප්‍රචලිත කිරීම සඳහා ප්‍රශස්ත යාන්ත්‍රණයක් නොමැති වීම හා සායනික පහසුකම් නොමැති වීම.

**අරමුණ :-**

දේශීය ඖෂධ හා දේශීය වෛද්‍ය ක්‍රම ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීම තුලින් නිරෝගිමත් ප්‍රජාවක් කොට්ඨාශ තුල ස්ථාපිත කිරීම

**උපාය මාර්ග :-**

දේශීය ඖෂධ භාවිතය හා රෝග නිවාරණයට ඉන් සිදුවන මෙහෙය පිළිබඳව දැනුවත් කිරීමේ සජීවී වැඩසටහන් පැවැත්වීම.

**ක්‍රියාකාරකම් :-**

1. දේශීය ආයුර්වේද දෙපාර්තමේන්තුව හා සමගාමීව නගර සභාව ද එක්වී ඖෂධ සායන පැවැත්වීම සම්බන්ධයෙන් ක්‍රමවත් වැඩසටහන් පෙළක් දියත් කිරීම
2. යෝජිත බහුකාර්ය සේවා පියසේ ප්‍රජා ශාලාව තුළ දේශීය ආයුර්වේද සායනයක් ස්ථාපිත කිරීම

## 5.පරිසර කළමනාකරණ හා ආපදා කළමනාකරණ සැලැස්ම

**ගැටලුව :-**

නියමිත කසළ හා අවශේෂ අපද්‍රව්‍ය ප්‍රවාහනය නිසි කලට නොකිරීම හේතුවෙන් ප්‍රජාවට ඉමහත් දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවීම

**අරමුණ :-**

විධිමත්ව කසල ප්‍රවාහනය කිරීමේ සැලැස්මක් ඇති කිරීම තුලින් ප්‍රජා දුෂ්කරතා මැඩලීම.

**උපායමාර්ගය:-**

1. නගර සභාවේ පවිත්‍රතා අංශය සමග සම්බන්ධීකරණයෙන් නිසි වැඩසටහන් සැකසීම
2. නගර සභාව හා අදාළ ප්‍රදේශවාසීන් සමග මනා ලෙස සම්බන්ධීකරණය කිරීම.
3. වසමට අදාළව ප්‍රජා කමිටු සකස් කර සුදුසු දීර්ඝකාලීන සැලැස්මක් සෑදීම.

**ක්‍රියාකාරකම් :-**

1. නගර සභාවේ ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම උදෙසා ක්‍රියා කිරීම.
2. අපද්‍රව්‍ය රැගෙන යාමේ දින පිළිබඳව ජනතාවට පුළුල් අවබෝධයක් ලබා දීම.

**කාලය :-**දිනපතා

**වගකීම:-**

1. ප්‍රජා සංවර්ධන හා පවිත්‍රතා නිලධාරීන්, දෙහිවල ගල්කිස්ස නගර සභාව
2. ප්‍රජා පොලිස් ඒකකවල
3. පරිසර පොලිසිය දෙහිවල

**ගැටලුව:-**

කැලිකසල බැහැර කරලීම සඳහා නියමිත ස්ථානයක් නොමැතිවීම මත අවිධිමත් කැලිකසල බැහැර කරලීම

**අරමුණ :-**

අපද්‍රව්‍ය හා කැලිකසල මනා ලෙස කළමනාකරණය කිරීමෙන් කැලි කසල සම්පතක් බවට පත් කිරීම.

**උපායමාර්ගයන් :-**

1. පරිසර හිතකාමී කැලිකසල බැහැර කරලීමේ උපායමාර්ග සකස් කිරීම.
2. නගර සභාව හා අදාළ ආයතන මනා ලෙස සම්බන්ධීකරණය කිරීම.

**ක්‍රියාකාරකම්:-**

1. එක කොම්පෝස්ට් බඳුන් හා කොම්පෝස්ට් බැරල් ලබාදීම.
2. කැලිකසල නිසි ලෙස ප්‍රමිතිගත කර බඳුන්ගත කිරීම.
3. ප්ලාස්ටික් හා ඉවතලන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කරන මධ්‍යස්ථානයක් ඇරඹීම
4. අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම උදෙසා වන ක්‍රියාවලිය සඳහා සුදුසු ආයතන වෙත යොමු කිරීම හා නිවෙස් තුළම හැකිතරම් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රමවේදයකට සුදුසු තාක්ෂණික උපදෙස් සහ ඉඩහසර ලබා දීම.
5. Eco-bricks නව ක්‍රමවේදයට උචිත ලෙස කසල බැහැර කළ වීමට ප්‍රජාව අනුගත කිරීම.

**කාලය :-**

දිනපතා

**වගකීම :-**

දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, මධ්‍යම පරිසර අධිකාරිය හා පරිසර නිලධාරීන්.

**ගැටළුව :-**

කොට්ඨාශය තුල ඩෙංගු මදුරු උවදුර උත්සන්නවීම

**අරමුණ**:-

ඩෙංගු මදුරු උවදුර ව්‍යාප්තියේ උපරිම පාලනයක් ඇති කිරීම

**උපාය මාර්ගය :-**

1. අදාල ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් වැඩසටහන් පැවැත්වීම
2. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඩෙංගු මර්දන බලකාය සමඟ සම්බන්ධීකරණය මනාව සිදු කිරීම

**ක්‍රියාකාරකම් :-**

1. වසමේ වීදි හා මාර්ග සම්බන්ධීකරණය කර වීදි කමිටු පිහිටුවා ප්‍රජා නායකයන් සමග සම්බන්ධ වී සිවිල් ආරක්ෂක කමිටු, ප්‍රජා කමිටු බලගන්වා සම්බන්ධීකරණය කර වැඩසටහන් සකස් කිරීම.
2. ගෙන් ගෙට ගොස් නිවෙස් දැනුවත් කර පරීක්ෂාවට ලක් කර, ශ්‍රමදාන සංවිධානය කර, පොදු ස්ථාන පිරිසිදු කිරීම
3. ඩෙංගු අවදානම වැඩි වීදිවලට දුමායන කටයුතු සිදුකිරීම
4. කොට්ඨාශය කාණු පද්ධතිය නිසි පරිදි පවිත්‍ර කරවීම
5. අපද්‍රව්‍ය හා කැලි කසල නිසි පරිදි එක්රැස් කරන ක්‍රමවේදයන් සැකසීම

**කාලය :-**

සතියට දවස් තුනයි

**වගකීම :-**

ප්‍රජා නායකයන්, ප්‍රජා හා පරිසර පොලිසිය නගර සභාව.

**ගැටලුව :-**

සුළු වර්ෂා කාලයකදී පවා ලියනගේ පාර වෛද්‍යා පාර වෛද්‍යා මාවත මල්වත්ත පාර ජලයෙන් යටවී ගංවතුර තත්ත්වයක් ඇති වී මල්වත්ත කොට්ඨාශය ප්‍රජාව දැඩි පීඩාවට ලක්වී එදිනෙදා ජීවන කටයුතු අඩාල වීම.

**අරමුණ :-**

වර්ෂා ජලය විධිමත්ව බැස යන ලෙස ප්‍රශස්ත ක්‍රමවේදයක් සකසා ගංවතුර පාලනය කිරීමෙන් ජනතාවට සහනයක් සැලසීම.

උපායමාර්ග :-

1. අවිධිමත් නාගරීකරණය වෙනුවට විධිමත් හා ක්‍රමවත් නාගරීකරණ ක්‍රියාවලියක් ඇති කිරීම.
2. වර්ෂා ජලය විධිමත් යන ලෙස බැස යන ලෙස ප්‍රශස්ත කානු පද්ධතියක් හා ක්‍රමවත් ඇළ මාර්ග පද්ධතියක් ස්ථාපිත කරලීම .

වගකීම :-

SLDC, නගර සභාව, ආපදා කලමනාකරණ නිලධාරි, සංවර්ධන නිලධාරී

ක්‍රියාකාරකම් :-

1. මල්වත්ත පාර අංක 45 සිට 65 දක්වා ජලය ක්‍රමවත්ව බැස යන අයුරින් කාණු පිලිසකර කර කාණුවල අවහිරතා ඉවත් කිරීම
2. මල්වත්ත පාර, ලියනගේ පාර, වෛද්‍ය පාර, වෛද්‍ය මාවත ආවරණය වන ඇළ මාර්ග ශුද්ධ කර ඒ ආශ්‍රිත වැසි ජල කාණු පද්ධතිය සැකසීම.
3. පරණ වෛද්‍ය පාරේ අංක 2 සිට අංක 34 දක්වා කානු පද්ධතිය ශුද්ධ පවිත්‍ර කර නිසි පරිදි සකස් කිරීම
4. ධර්මරාජ පාරේ අංක 21 සිට ඉදිරියට මල්වත්ත පාර දක්වා කාණු පද්ධතිය ශුද්ධ පවිත්‍ර කර කානුවල බැම් බැඳ පිළිසකර කිරීම

කාලය :-

වසරේ එකයි

වගකීම :-

SLDC හා දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, සංවර්ධන නිලධාරී, තාක්ෂණ නිලධාරි හා සැලසුම් අධ්‍යක්ෂ

## 6.ජීවනෝපාය සංවර්ධන සහ ව්‍යවසාය සංවර්ධන සැලැස්ම.

ගැටලුව :-

මල්වත්ත පාර, වෛද්‍ය පාර, මල්වත්ත හරස් පාර ආශ්‍රිතව පවුල් සීයකට පමණ ප්‍රමාණවත් ආදායම් මාර්ගයක් නොමැති වීම නිසා සමාජ ආර්ථික ගැටලුවලින් පීඩා විඳීම

අරමුණ:-

ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති ප්‍රජාව ආර්ථික වශයෙන් බල ගැන්වීම.

උපායමාර්ග :-

ආදායම් මාර්ග ජනිත වන ස්වයං රැකියා සඳහා යොමු කිරීම.

ක්‍රියාකාරකම් :-

1. ස්වයං රැකියා උපකරණ ලබාදීම.
2. ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම.
3. සහන පොලී අනුපාත යටතේ ඉදිකිරීම් පාදක කරගනිමින් ණය ලබාදීම.
4. ව්‍යවසායකයන් පුළුල් කිරීම සඳහා විවිධ වැඩසටහන් සම්පාදනය කිරීම.

කාලය :-වසර එකයි

වගකීම :-

කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි, විද්‍යාතා තාක්ෂණ නිලධාරි, ව්‍යවසාය සංවර්ධන නිලධාරි.

ගැටලුව :-

නිෂ්පාදනයන් සඳහා වෙළෙඳපොළ ධාරිතාව අවම වීම හා නිෂ්පාදන අලෙවි කිරීමේ දුෂ්කරතා මතු වීම.

අරමුණ :-

පුළුල් නිෂ්පාදන වෙළඳපලක් සැකසීම හා නිෂ්පාදන අලෙවිය වර්ධනය කරලීම .

උපායමාර්ග :-

1. සමජාතිය නිෂ්පාදනයන් හා තරඟ කිරීම සඳහා තරගකාරි නිෂ්පාදන රටාවක් වෙළඳ පලට ප්‍රවේශ කරවීම.
2. උසස් සනයේ නිෂ්පාදනයක් බිහිකිරීම
3. උසස් ගණයේ නිෂ්පාදනයන් බිහිකිරීම සඳහා විද්‍යාතා තාක්ෂණ නිළධාරි, කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරින්ගේ මග පෙන්වීම් ලබා ගැනීම

**<u>ක්‍රියාකාරකම්:-</u>**

1. නිෂ්පාදකයන්ට ආකර්ෂණීය ඇසුරුම්කරණය ලේබල්කරණය සඳහා පුහුණු වැඩමුළු ලබාදීම.
2. හොඳ වෙළඳ සන්නාමයක් ඇති කිරීම හා මනාවූ වෙළඳ ප්‍රවර්ධනයක් තමන්ගේ නිෂ්පාදන සඳහා ලබාදීම.

**<u>කාලය:-</u>** වසර එකයි

**<u>ප්‍රතිලාභීන් :-</u>**125

**<u>වගකීම :-</u>**

කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි, වනිතා සංවර්ධන නිලධාරී, විදාතා තාක්ෂණ නිලධාරී .

## <u>7.කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම</u>

**<u>ගැටලුව :-</u>**

නාගරික ප්‍රජාව ගෙවතු වගාවට යොමු නොවීම මත එළවළු හා පලතුරු මිලදී ගැනීමට අධික මුදලක් වැය වීම.

**<u>අරමුණ :-</u>**

නාගරික ප්‍රජාව අතර ගෙවතු වගාව ප්‍රචලිත කිරීම තුළින් එළවළු පලතුරු සඳහා යන වියදම අවම කරවීම.

**<u>උපායමාර්ග :-</u>**

1. අවම ඉඩකඩකින් වැඩි ඵලදාවක් සහිත වගා ක්‍රම හා බෝග වර්ග හඳුන්වා දීම.
2. වසමේ ප්‍රජාව වගාවන් සඳහා අභිප්‍රේරණය කරවීම.

**<u>ක්‍රියාකාරකම්:-</u>**

1. වැඩි ඵලදාවක් සහිත දෙමුහුම් බීජ හඳුන්වා දීම.
2. වසමේ රාජ්‍ය නිලධාරීන් ඒකාබද්ධ කර ගනිමින් ප්‍රජාව උදෙසා කෘෂි වගා හා කෘෂි ප්‍රවර්ධන වැඩසටහන් සිදු කිරීම.
3. තිරස් වගාව හඳුන්වා දීම.
4. මහල් නිවැසියන්ට ටෙරස් ගාර්ඩන් සංකල්පය හඳුන්වා දීම.

**ගැටලුව :-**

නාගරික බල ප්‍රදේශයක් වන මල්වත්ත වසමේ පවතින සීමිත ඉඩකඩ නිසා වගාවන් සඳහා අවකාශ අඩුවීම.

**අරමුණ :-**

පවතින සීමිත ඉඩකඩ තුළ වගාවන් උපරිම සිදු කිරීම උදෙසා ප්‍රජාව යොමු කරවීම.

**උපායමාර්ග :-**

වගා කටයුතු සඳහා ප්‍රජාව අභිප්‍රේරණය හා දිරි ගැන්වීම් කරවීම.

**ක්‍රියාකාරකම් :-**

1. බඳුන්ගත වගාවන් හඳුන්වාදීම.
2. හයිඩ්‍රොපොනික් වගාව හඳුන්වා දීම.
3. සිරස් වගා ජනතාව අතර ප්‍රචලිත කරවීම.
4. කෘෂිකාර්මික ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කරවීම

**කාලය :-**

වසර 1

**වගකීම :-**

කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරී, කෘෂිකර්ම සංවර්ධන නිලධාරී, සංවර්ධන නිලධාරි.

## 8.නිපුණතා සංවර්ධන හා හැකියා වර්ධන සැලැස්ම

**ගැටලුව :-**

පාසල් හැර ගිය තරුණ තරුණියන් තුළ වෘත්තීමය කුසලතා අවම වීම හේතුවෙන් විරැකියාවෙන් පෙළීම.

**අරමුණ :-**

තරුණ තරුණියන්ගේ නිපුණතා මට්ටම ඉහළ නංවා රැකියා අවස්ථා පුළුල් කිරීම.

**උපායමාර්ගය:-**

නිපුණතා මට්ටමට අඩු තරුණ තරුණියන් වෘත්තීය පුහුණු සඳහා යොමු කරවීම.

**ක්‍රියාකාරකම් :-**

1. වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන කරා යොමු කරවීම.
2. තරුණ නායකත්ව පුහුණු කඳවුරු වැඩසටහන් පවත්වා නායකත්ව පුහුණු ඇති කිරීම.

**කාලය :-**වසර එකයි

**ප්‍රතිලාභීන් :-**සියයයි

**වගකීම :-**

නිපුණතා සංවර්ධන නිලධාරි, මානව සම්පත් සංවර්ධන නිලධරී, විදාතා තාක්ෂණ නිලධාරී.

ගැටලුව:-

කලා කුසලතා හා භාෂා හැකියාවන් දියුණු කර ගැනීමට නව පරපුර උනන්දු නොවීම මත යථෝක්ත කුසලතාවයන් අවම වීම.

**අරමුණ :-**

කලා හා කලා භාෂා කුසලතා වලින් පිරිපුන් ප්‍රජාවක් බිහි කිරීම.

**උපායමාර්ග :-**

කලා ආයතනයක් හා භාෂා විද්‍යාගාරයක් ස්ථාපිත කර හා පිරිස් ඒ සඳහා යොමු කරවීම

**ක්‍රියාකාරකම් :-**

1. කලා ආයතනයක් පිහිටුවීම.
2. භාෂා පුහුණු සැසි පැවැත්වීම.
3. භාෂා කුසලතාවයන් වර්ධනය කරලීමට අන්තර්ජාල පහසුකම් හා මාර්ගගත පහසුකම් වර්ධනය කරලීම.
4. සංස්කෘතික තරග හා විවිධ ප්‍රසංග පැවැත්වීම.
5. රසවින්දන වැඩසටහන් පවත්වා රසවින්දන කුසලතාවයන් වර්ධනය කරලීම.

**කාලය :-**

වසර එකයි.

**ප්‍රතිලාභීන් :-**

සියයයි.

**වගකීම:-**

සංස්කෘතික නිලධාරී, ජාතික භාෂා එකාබද්ධතා නිලධාරී.

## 9.තරුණ සංවර්ධන හා කාන්තා සවිබලකරණ සැලැස්ම

නව සියවසේ අභියෝග ජය ගැනීමට නිර්මාණශීලිව තරුණ තරුණියන් දිරිගැන්වීම හා සමාජ අභියෝග හමුවේ ඒවාට මුහුණදීමට උචිත පසුබිමක් සකස් කරවීමේ වේදිකාවක් සකස් කිරීම සඳහා තරුණ සංවර්ධන හා කාන්තා සවිබලකරනය උපයෝගී කරගත යුතුය.

1. වත්මන් සමාජයට විවෘත වීමේ ප්‍රමුඛ දොරටුව වන්නේ විද්‍යා හා තොරතුරු තාක්ෂණ බැවින් ඒ පිළිබඳ තරුණ පෙළ දැනුවත් කිරීම හා අවශ්‍ය කුසලතාවන් සංවර්ධන කිරීමේ වැඩසටහන් වෙත යොමු කිරීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා යොමු විය යුතු ආයතන ලෙස වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික තරුණ සේවා මධ්‍යස්ථානය ආශ්‍රිත පල්ලිදොර කව්ඩාන මධ්‍යස්ථානය, කාර්මික සංවර්ධන මණ්ඩලය, පුහුණු මධ්‍යස්ථාන හඳුනාගෙන ඇත.
2. සංස්කෘතික අභිප්‍රාය සහිත තරුණ තරුණියන් බිහිකිරීම උදෙසා සෑම තරුණයෙක් උදෙසාම සංස්කෘතික දායාද සමග ජීවත් වීම හා ඒ ආශ්‍රිත සංස්කෘතික කලාවන් ප්‍රගුණ කිරීම මෙයින් අපේක්ෂා කෙරේ. කලාත්මක අගයන් ඇගයීම, බහුවාර්ගික සංස්කෘතික අධ්‍යයනය, විවිධ ජාතීන් සමඟ සහයෝගයෙන් හා සමානාත්මතාවයෙන් යුක්තව සංස්කෘතික හුවමාරු වැඩසටහන් පැවැත්වීම පියවර ගනනාවක් යටතේ වැඩසටහන් සංවිධානය කිරීම අභිප්‍රායයි.
3. ස්වේච්ඡාවෙන් හා සහයෝගිතාවයෙන් යුතු තරුණ පිරිසක් බිහි කිරීම - විශේෂයෙන් නාගරීකරණය හා තරගකාරිත්වය සමඟ සිදුවන සංවර්ධනය සමඟ ආත්මාර්ථකාමී හැඟීම වැඩිවෙන බැවින් තරුණ පෙළ ස්වෙච්ඡා සේවය තුලින් යහපත් පුද්ගලයන් මතු කිරීම

මෙමගින් අපේක්ෂා කෙරේ. මේ සඳහා පුහුණු යොවුන් කඳවුරු පැවැත්වීම, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වීම, ගමේ ශ්‍රමදාන පින්කම් ආගමික කටයුතු උදෙසා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වීම තුලින් තරුණ පෙළ ස්වෙච්ඡා සේවය තුලින් යහපත් පුද්ගලයකු ලෙස මතු කිරීම සඳහා ආකල්ප සංවර්ධනය කිරීම හා පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන් දියත් කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.

4. තරුණ තරුණියන් හා කාන්තාවන් නායකත්ව කුසලතා සංවර්ධනය සඳහා ප්‍රාදේශීය වැඩසටහන් පැවැත්වීම වසම් මට්ටමින් අපේක්ෂා කිරීම.

5. ව්‍යවසායකත්ව හා කාන්තා සවිබලකරනය සඳහා වූ ප්‍රාදේශීය වැඩසටහන් පැවැත්වීම තුළින් තරුණයන්ගේ හා කාන්තාවන්ගේ කුසලතාවයන් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

6. තරුණ තරුණයන් වෙනුවෙන් විදේශීය භාෂා අධ්‍යාපනය සඳහා ප්‍රාදේශීය වැඩසටහන් පැවැත්වීම තුළින් ඔවුන්ගේ භාෂා ප්‍රවීණතා වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

7. විධිමත් වෘත්තීය පුරු වැඩසටහන් තුලින් විශේෂයෙන් රැකියා විරහිත ගෘහ ආශ්‍රිත කාන්තාවන් ඉලක්ක කර ගනිමින් ඔවුන් බලගැන්වීම සඳහා ඔවුන්ගේ පවුලේ ජීවන තත්වය උසස් කිරීම සඳහා යොමු කරවීමට අපේක්ෂා කෙරේ.

8. තරුණ තරුණියන් හා කාන්තාවන් ප්‍රමුඛව මුහුණ දෙන ගැටලු හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීම සිදුකිරීමට අපේක්ෂා කරේ. උදාහරණ විරැකියාව, මත්ද්‍රව්‍ය ප්‍රශ්නය, මානසික පීඩාවන් හා ආතතිමය තත්ත්වයන් හඳුනාගෙන උපදේශන සේවාවන් සඳහා යොමු කරවීමත් විරැකියාවෙන් පෙළෙන අය සඳහා ස්වයං රැකියා පුහුණු වැඩසටහන් ලබාදීමත් අපේක්ෂා කෙරේ.

# 10.ඇමණුම -1

**ජීවනෝපාය සංවර්ධනය උදෙසා නව ප්‍රවනතා**

**හදුනා ගැනීම :- මල්වත්ත වසම**

නුතන තරුණ පරපුර රජයේ හෝ පෞද්ගලික රැකියාවල නිරත නොවී තමන්ගේම ජීවනෝයන් සකස් කර ගැනීමේ නව ප්‍රවනතාවක් ඇතිව තිබෙ. එ සදහා මල්වත්ත වසමෙ අප විසින් හදුනාගත් ජීවනෝපාය සංවර්ධන සදහා වූ ක්‍රියාකාරකම් කිහිපයක් .

I. අන්තර්ජාලය හරහා මුදල ඉපයීමේ ක්‍රම රසක් අද වන විට පවති. රු 15000ක් වැනි මුදලකට Desk Top පරිගණකයක් මිලදී ගෙන මේ සදහා කාලය යෙදවිය හෙකිය. ඔවුන් විදිමත් පුහුණුවක් ලබාදීම යෝග්‍යයයි.
II. Drop Shipping හරහා මුදල් ඉපයීම.
III. Uber Eat වෙනි ආයතනයන්හි ලියාපදිංචිවී ස්වයං රුකියාවක් ලෙස තමන්ගේම ආහාර මෙනු පතවල් සකසාගෙන Self Online Restaurant ආරම්භ කළ හැකිය.
IV. Add Click කිරීම - වෙළෙඳ දැන්වීම් සලකුණු කර විසාල ලෙස මුදල් ඉපයීය හැකිය.
V. කිසිදු ගොඩනැගිලි පරිශ්‍රරයක් නොමැතිව තමන්ගේම ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කර ගනිමින් නිශ්පාදන වෙළෙඳපොළක් මාර්ගගත ක්‍රමයන් ඔස්සේ සකස්කර ගැනීම සිදුකරගත හැකිය. ebay,ali-baba වෙනි ආයතනද වර්මාන ලෝකයේ මෙලෙස දෙවන්තයන් වී සිටුනුයේ online stors ප්‍රවර්ධනය කිරීම හරහාය.
VI. පරිගණක මෘදුකාංග යෙදවුම් සංවර්ධන කිරීමෙ අවස්ථා සදහාද නූතන පරපුර වැඩි අවදානයක් සිදු කරනු දක්නට ලැබේ.වෙබ් අඩවි නිර්මාණ තුළින් වර්තමානයේ හොඳ ආදායමක් ලබාගත හෙකිය.එවැනි ආදායම් උත්පාදන අවස්ථා තරුන පරපුරට හදුන්වා දීමෙ ජීවනෝපාය සංවර්ධන වැඩ පිළිවෙළක් සකස් කිරීම සුදුසුය.

# 11.ඇමුණුම-2

<u>ළමා සංවර්ධනය .</u>

සමාජ සංවර්ධනය සිදුකිරීමේදී තිරසාර ඇමෙන්ම සුරක්ෂිත සමාජ පසුබිමක් ගොඩනංවාලීම නූතන ලෝකය මුහුණ දෙන බ්‍රබලතම අභියොගයකි.අප රටද දිගු කාලයක පටන් මේ ගෙටලුවට මුහුණපා සිටි.මෙරට ළමයින් වෙනුවෙන් සුවිශේෂී කාර්‍ය භාර්‍යක් සිදුකරනුයයේ ළමාරක්ෂක අධිකාරියයි. ළමාරක්ෂාව තහවුරු කිරිමෙ සමස්ථ ක්‍රියාවලිය තුල ළමා අපයෝජනය සිදුවීමට පෙර ඒවා වලක්වා ගැනීමට කටයුතු කිරීම කෙරෙහි ළමාරක්ෂක අධිකාරියේ විශේෂ අවධානය යොමුව ඇත.ළමයන්ට එරෙහිව සිදුවන විවිධාකාරයේ අපයෝජනවලට බලපාන සාධක රාශියක් හදුනාගෙන ඇත.ඒවා අතර,

1. වැඩිහිටියන් හා පාසල් දරුවන් මත්ද්‍රව්‍ය පාවවනයේ ගොදුරු වී ඇත.

2. දිළිඳුකම හා බැඳුණු ජීවත් වීමේ ආර්ථික අපහසුතා.

3. බිඳුණු පවුල් පරිසරය ළමයින් ජීවත් වීම.

4. රැකවරණයක් නොමැති පවුලක ළමයින් ජීවත් වීම.

5. මාධ්‍ය හා සමාජ ජාල වෙබ් අඩවි භාවිතය සම්බන්ධයෙන් ඇති නොදැනුවත්කම, මෙහිදී තාක්ෂණ අවභාවිතය හා මෙවලම් සුලභ වීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

6. ළමයින් පිළිබද ඇති සමාජ ආකල්ප හා තමුන්ගේ ළමයා පිළිබඳව පමණක් සිතීම.

7. ළමා අපයෝජන ඒවා වළක්වා ගැනීම සම්බන්ධයෙන් පවතින නොදැනුවත්කම හා උදාසීනත්වය මෙන්ම අපයෝජකයන්ගේ බලය සාධනයට ඇති හය පක්ෂපාතී බව.

8. නීතිය පිළිබඳව නොදැනුවත්කම හා ආයතන වල ඒ සම්බන්ධව කටයුතු සිදුකරන ආකාරය පිළිබඳව ඇති නොසතුට.

9. වගකීමෙන් තොරව මව්වරුන් විදේශගත වීම.

10. තරගකාරී විභාග රටාවක් තුළ ළමයින්ගේ මනස තුළ වර්ධනය වන දැරිය නොහැකි පීඩනය යන ආදිය ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගනී.

11. වගකීමෙන් තොර මාධ්‍ය භාවිතය.

මෙම සාධක වලින් වැළකිය හැකි නම් ලමා අපයෝජන බොහෝ දුරට වළක්වා ගත හැකිය.

කොට්ඨාස මට්ටමින් පවතින යෞවන සමාජ,අවමංගල්‍යාධාර සමිති,සමථ මණ්ඩල කාන්තා සමිති,ග්‍රාම සංවර්ධන සමිති,ක්‍රීඩා සමිති හා ක්‍රියාකාරී සිවිල් සංවිධාන සාමාජිකයන් නියෝජනය කරමින් ළමා ආරක්ෂාව තහවුරු වීම සඳහා බලපෑම් කළ හැකි හා ඒ සම්බන්ධ ආකල්ප, දැනුම හා කුසලතාවය ලබාගත් ප්‍රජා බලමුළුවක් නිර්මාණය කළ යුතුය.

ඊට අමතරව ළමයින් සම්බන්ධයෙන් වන තොරතුරු ඇතුළත් ප්‍රාදේශීය දත්ත පද්ධතියක් ස්ථාපිත කර එය ළමයින් සම්බන්ධව පවතින ජාතික දත්ත පද්ධතියට සම්බන්ධ කළ යුතුය. එම දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම ළමා සංවර්ධන නිලධාරී හා ළමා හා පරිවාස නිලධාරීන්ගේ වගකීමයි.

උචිත පියවර ගැනීම උදෙසා කොට්ඨාශ මට්ටමින් ළමා අපයෝජන හා ළමා අපචාර වැළැක්වීම මෙන්ම තම ගම තුල සිටින විදෙස් ගත දෙමාපියන්ගේ ළමයින් සුරැකීමට අවශ්‍ය අවස්ථාවන්හිදී උචිත පියවර රැසක් ගම් හා කොට්ඨාස මට්ටමින් තම ආරක්ෂාව තහවුරු කරන ජනතා සහභාගිත්වයෙන් යුත්ත ප්‍රබල විධිමත් යාන්ත්‍රණයක් ගොඩනැගීම කාලීන අවශ්‍යතාවයකි.

මීට අමතරව ළමා අපයෝජනයට නතු විය හැකි අවදානම්කාරී ළමයින් ලෙස මව හෝ පියා මියගිය දරුවන්,දෙදෙනාම මියගිය දරුවන්,දික්කසාද වූ දෙමව්පියන් සිටින දරුවන් , මව හෝ පියා පවුල හැර යෑම ,ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය උග්‍රව පවතින නිවාස වල වෙසෙන දරුවන් පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය.

අන්තර්ජාලයේ ආරක්ෂිතව භාවිත කරන ළමයින්ට අන්තර්ජාලය හරහා අසභ්‍ය දර්ශන ,අසභ්‍ය වීඩියෝ ,අසභ්‍ය පින්තූර හෝ සයිබර් බලපෑම් වලට ලක්වීමේ ප්‍රවණතාව වැඩිය. ඊට අමතරව ළමා මෙහෙකාර සේවයේ යෙදෙන දරුවන් කායික හා මානසික ගැටලු සහිත විශේෂ අවශ්‍යතා සහිත ලමයි ,නරක මිතුරන් ඇසුරට වැටුණු ළමුන් ,ස්වාභාවික විපත් සහ හදිසි අවස්ථා වලට මුහුණ දුන් ළමයින් එලෙස අපයෝජනයට ලක්විය හැකි ආරක්ෂා කළ යුතු ගණයට වැටෙන දරුවන් සේ සැලකිය යුතුය.කොට්ඨාශය තුල සිටින ළමා ආරක්ෂක නිලධාරීන් හා පරිවාස නිලධාරී ,ළමා සංවර්ධන නිලධාරීන් ,සමාජ සේවා නිලධාරීන් ,සංවර්ධන නිලධාරීන් පූර්ව ළමාවිය සංවර්ධන නිලධාරීන් ළමයින් වෙනුවෙන් ඇපකැපවී සිදු කළ හැකි කාර්යභාරය පිළිබඳව වගකීමකින් කටයුතු කිරීම කාලීන අවශ්‍යතාවයකි.

## 12.ඇමණුම-3

ආර්ථික ඵලදායි ව්‍යාපෘතිය, කෘෂිකර්ම සංවර්ධන සැලැස්මට අදාළව.

විජය විද්‍යාලයේ ඔසු උයනක් ඇරඹීම.

අරමුණු හා අභිමතාර්ථ:-

1. විනාශ වෙමින් යන ඖෂධ පැළෑටි සංරක්ෂණයකිරීම.

2.දේශීය ඖෂධ විද්‍යාව පිළිබඳව කිසියම් හෝ අවබෝධයක් ලබා ගැනීම හා අන්‍යයන්ට ඒ පිළිබඳව දැනුම ලබා ගැනීමට සැලැස්වීම.

3.පාසලේ ඇති අතිරික්ත ඉඩ ප්‍රමාණය උපරිම ඵලදායීත්වය ලබාගත හැකි වන පරිදි ආර්ථික වශයෙන් ඵලදායී ව්‍යාපෘතියක් නිර්මාණය කිරීම.

**<u>රෝපණය කිරීමට බලාපොරොත්තු වෙනවා ඖෂධ පැළෑටි.</u>**

1.දෙළුම් - උදර හා සෙම් රෝග වලට.

2.වැල්පෙනෙල - වා පිත් සමනය කරයි .

3.අමු කහ - ඇදුම,පීනස හා අපස්මාරයට.

4. මොනරකුඩුම්බිය - සෙංගමාලය සමය තුවාල ආදිය.

5.කුප්ප මේනිය - පණු හා සෙම් රෝග වලට .

6.පාවට්ටා - ඇදුම .

7. නිදිකුම්බා - සමයේ තුවාල,කැසීම් හා මුත්‍රා රෝගවලට,

8. ඉඟුරු - තුන්දොස් සමනය කරයි.

9.සරණ - ඉදිමුම් හා මුත්‍රා ගල්වලට.

10. කොහොඹ - උන සැම හා සමයේ කුෂ්ඨ වලට.

11. ඇඹුල් ඇබිලි - අජීර්ණ හා අතීසාරය.

12.තිප්පිලි - කෙස් සහ කතිකාවට .

13.කෝමාරිකා - සමේ පිලිස්සීම් හා උදර ආම්ලිකතා රෝගවලට.

14. කරපිංචා - සර්ප විශ , චර්ම රෝග ,කොලෙස්ට්‍රෝල් පාළනයට.

15.ඇත්තෝර - සමයේ රෝග, අක්මාව පිරිසිදු වීමට ,සමයේ රෝගාතුර පිරිසිදු කිරීමට.

16.ඉරි වේරිය - අතීසාරය හා සුදු කබර වලට.

17.බැබිල - තුවාල පිරිසිදු කිරීමට හා බරවා රෝගය .

18.කොටකිඹුල - කැඩුම් බිඳුම් හා අස්ථි සවිකිරීමට.

19.පොල්පලා - මුත්‍රා රෝගවලට.

<u>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ආකාරය</u>

1. ගොවිජන සේවා නිලධාරීන් හා කෘෂිකර්ම නිලධාරීන්ගේ හා ප්‍රජා දායකත්වය යුතුව අදාල රෝපිත ද්‍රව්‍ය ලබා ගැනීමට කටයුතු කිරීම.

2. විදුහල්පතිතුමාගේ පූර්ණ දායකත්වය හිමිවන නිසා ව්‍යාපෘතිය මාස තුනක් ඇතුළත සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට නියමිතය .

3.පර්චස් 80 ක පමණ භූමි ප්‍රමාණය උපයෝගී කරගැනීමට බලාපොරොත්තු වේ .

4. දේශීය ඖෂධ හා දේශීය ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හරහා ඖෂධීය ගුණය පිළිබඳව සාමාන්‍ය ජනතාව හා ශිෂ්‍ය ප්‍රජාව අතර ප්‍රශස්ත දැනුමක් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුලින් ඇතිවේ යැයි අපේක්ෂා කෙරේ. දේශීය ආයුර්වේදය හා ජනතාවට ලබාගත හැකි ඵලදායීත්වය පිළිබඳව මේ උයන ස්ථාපිත කිරීමෙන් කිසියම් ප්‍රතිරූපයක් ලබාගත හැකි වේයෙය් අපේක්ෂා කරනු ලබයි.